# කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

## ටෙන්ඩර් දැන්වීම

## ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (IWWRMP)

ව්‍යාපෘති අංකය: **P166865 ,** ණය අංකය: **IDA-6621 LK**

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ජාත්‍යන්තර සංවර්ධන ආයතනය (**International Development Association),** ලෝක බැංකුව **(World Bank)** වෙතින් ඒකාබද්ධ ජල හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා මූල්‍ය පහසුකම් ඉල්ලුම් කර ඇති අතර**,** එම ණය මුදලින් කොටසක් පහත වගුවේ දැක්වෙන ඉදිකිරීම් කොන්ත්‍රාත් කාර්යයන් සඳහා යෙදවීමට අදහස් කර ඇත.

2. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති වෙනුවෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10, ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 09 වන මහලේදී **2025.09.16** දින **පෙ.ව. 11.00** දක්වා එම කාර්යය සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

| වැඩ විස්තරය | කොන්ත්‍රාත් අංකය | පළපුරුද්ද/ CIDA ලියාපදිංචි ශ්‍රේණිය | ලංසු බැදුම්කරය / ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුව | *පූර්ව ලංසු රැස්වීම* |
|---|---|---|---|---|
| **මහවැලි "එච්" කලාපයේ කලා වැව දකුණු ඉවුර ප්‍රධාන ඇලෙහි වම් බැම්මෙහි, කිලෝමීටර 3+960 සිට කිලෝමීටර 4+110 දක්වා රැඳවුම් බැම්ම ඉදිකිරීම.**<br><br>**(ඇස්තමේන්තු මුදල*:* විචලන සහිත හා වැට් රහිතව රු. මි. *31.14* සහ කොන්ත්‍රාත් කාලය*:* දින 270)** | **L,K-MOMDE-500935-CW-RFB** | **ශ්‍රේණිය*: C6* හෝ ඉහල**<br><br>**ප්‍රවීනතාවය*:*** ***වාරිමාර්ග හා ජලාපවාහන*** | ***ලංසු බැදුම්කර මුදල: රු 410,000.00***<br><br>***වලංගු කාලසීමාව:*** **2026/02/10** ***දින දක්වා***<br><br>**ටෙන්ඩර් ගාස්තුව:** ***රු. 7,500.00*** | ***දිනය :*** **2025/09/09**<br><br>***වේලාව :*** ***පෙ. ව.*** **10.00** ***ට***<br><br>***ස්ථානය:*** **නේවාසික ව්‍යාපාර කළමණාකාර** ***කාර්යාලය, "එච්"*** **කලාපය,** ***තඹුත්තේගම*** |

3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට, සාර්ථක ලංසු කරු අසාදු ලේඛණගත කර නොතිබිය යුතු අතර ලංසු දත්තවල අවශ්‍යතා සපුරාලිය යුතුය.

4. මෙම කාර්යයන් සඳහා ඉල්ලුම් කිරීමට සුදුසු වනුයේ ඒ ඒ කාර්යය සඳහා ඉහත සටහනෙහි සඳහන් කර ඇති ඉදිකිරීම් ශ්‍රේණියට සහ ක්ෂේත්‍රයට අදාලව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ(CIDA) ලියාපදිංචි වී ඇති සහ මිලියන 5 ඉක්මවන කොන්ත්‍රාත් සම්බන්ධයෙන් වන විට ලංසුකරුවන් 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ විධිවිධාන යටතේ සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේද ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් පමණි. ලෝක බැංකු ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් සහ රෙගුලාසි ඇගයීම සඳහා අදාළ වේ.

5. අදාල සුදුසුකම් සහිත කොන්ත්‍රාත්කරුවන් සමාගම් ලිපි ශීර්ෂයක් මගින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර මුදලින් ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තුවක් ගෙවා කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 500 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 3 වන මහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා) ගේ කාර්යයාලයෙන් මෙම කාර්යයන් සඳහා වූ ටෙන්ඩර් පත් කට්ටල ලබා ගත හැක. ටෙන්ඩර් පත් නිකුත් කරනුයේ **2025.09.02** දින සිට **2025.09.15** දින දක්වා **පෙ.ව. 09.30** සිට **ප.ව. 03.00** දක්වා පමණි. ඕනෑම ටෙන්ඩර්කරුවකුට එක් කාර්යයකට වඩා ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට හැකි වුවත් කොන්ත්‍රාත් ප්‍රදානය කරනු ලබන්නේ කොන්ත්‍රාත්කරුගේ(CIDA) ලියාපදිංචි සීමාවන්ට අනුකූලව පමණි.

6. ටෙන්ඩර් පත් **කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 500 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 3 වන මහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා)** ගේ කාර්යයාලයෙන් **2025.09.02 දින සිට 2025.09.15** දින දක්වා වැඩකරන දිනයන්හි **පෙ.ව. 09.30 සිට ප.ව 04.00** දක්වා කිසිදු ගෙවීමකින් තොරව පරීක්ෂා කල හැකි අතර **http//mahaweli.gov.lk** වෙබ් අඩවිය හරහාද ටෙනඩර් පත් පරීක්ෂා කල හැක.

7. කවරයේ ඉහල වම් කෙලවර ටෙන්ඩරයේ නම සහ අංකය පැහැදිලිව සඳහන් කර, මුල් පිටපත හා **<u>තවත් පිටපතකින්</u>** යුතුව කවරයේ බහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් **2025.09.16** දින **පෙ.ව. 11.00** ට පෙර ලැබෙන සේ **කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 500 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 9 වන මහලේ අධ්‍යක්ෂ ජනරාල්** වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය, නැතහොත් අතින් ගෙනවිත් භාර දිය යුතුය. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ටෙන්ඩර් පත් විවෘත කරන අතර ටෙන්ඩර් පත් ඉදිරිපත් කල ටෙන්ඩර්කරුද ඔහුගේ නියෝජිතයින්ද ඇතුළුව දෙදෙනෙකුට නොවැඩි වන සංඛ්‍යාවකට එම අවස්ථාවට සහභාගී විය හැක.

8. මෙම කාර්යයන් පිලිබඳ වැඩි විස්තර නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා), ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, තාක්ෂණ සේවා අංශය වෙතින් ලබාගත හැක. දුරකථන අංක **011-2689651, 011-2687475 ,** විද්‍යුත් තැපැල **ddgts.masl@gmail.com.**

අධ්‍යක්ෂ ජනරාල්
<u>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය</u>